## NAPLAN සඳහා සහභාගී වීම

වසර 3, 5, 7 සහ 9 සියලුම සිසුන් වාර්ෂික NAPLAN ඇගයුම් වලට සහභාගී වීම අපේක්ෂිතය.

ආබාධතා සහිත සිසුන්ට පන්ති කාමරයේ ඇගයුම් වලදී සාමාන්‍යයෙන් සැපයෙන උපකාර පිළිබිඹු වන විශේෂ විධිවිධාන ලබා ගැනීමට සුදුසුකම් ලබා ගැනීමට පුලුවන. ඔබේ ළමයා සඳහා යම් ආබාධ විධිවිධාන ලබාදීම ගැන ළමයාගේ ගුරුවරයා සමග ඔබ පලමුවෙන් සාකච්චා කල යුතුය.

ඇගයුම් සඳහා සහභාගි වීමේ හැකියාව දැඩි ලෙස සීමා කරණ ආබාධතා සහිත, හෝ මෑතකදී ඔස්ට්‍රේලියාවට පැමිණි ඉංග්‍රීසි කතා නොකරන පසුබිමක් සහිත සිසුන්ට මෙම ඇගයුමෙන් විධිමත් නිදහස් කිරීමක් ලබා ගත හැකිය.

විශේෂ විධිවිධාන ගැන හෝ විධිමත් නිදහස් කිරිමක් ලබාගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටිය ගැන වැඩිදුර විස්තර ඔබේ පාසැලේ විදුහල්පතිගෙන් සහ ඔබේ ප්‍රදේශයේ පරීක්ෂණ පරිපාලණ අධිකාරයෙන් ඔබට ලබා ගැනීමට පුළුවන.

## මාර්ගගත NAPLAN 2019 පරීක්ෂණ කාල සටහන

මාර්ගගත NAPLAN සඳහා වන විභාග කාලසීමාව මුද්‍රණ පාදක විභාගය සඳහා දින තුනක සිට දින නමයක් දක්වාද දීර්ග කර ඇත. මෙසේ කර ඇත්තේ උපකරන අඩු පාසල් වලට වඩාත් නම්‍ය ලෙස විභාග දින නියම කරගැනීම පහසුවන පිණිසය. මාර්ගගත NAPLAN ඇගයුම් කාල සීමාව මැයි 14 වන අඟහරුවාදා දින පටන්ගෙන 2019 මැයි 24 වන සිකුරාදා දින අවසන්වේ.

මාර්ගගත පරීක්ෂණ සඳහා පහත පෙනෙන අනු පිලිවෙලට පෙනී සිටිය යුතුය.

| පරීක්ෂණය | කාලසීමාව | අනුපිළිවෙළ | විස්තර |
|---|---|---|---|
| ලිවීම | 3 වසරඃ මිනිත්තු 40<br>5 වසරඃ මිනිත්තු 40<br>7 වසරඃ මිනිත්තු 40<br>9 වසරඃ මිනිත්තු 40 | මුල් දින දෙක තුලදී සම්පූර්ණ කල යුතුය | 3 වසර සිසුන් පළමු දිනයේ පමනක් මුද්‍රිත-පාදක ලිවීමෙ විභාගයට සහභාගි වනු ඇත |
| කියවීම | 3 වසරඃ මිනිත්තු 45<br>5 වසරඃ මිනිත්තු 50<br>7 වසරඃ මිනිත්තු 65<br>9 වසරඃ මිනිත්තු 65 | ලිවීම පරීක්ෂණයට පසු සම්පූර්ණ කල යුතුය | තොරතුරු දක්වන, චිත්තෝත්පාදක සහ එත්තු ගන්වන සුළු පාඨ පරාසයක් සිසුන් විසින් කියවනු ඇත |
| භාෂා සම්මතයන් | 3 වසරඃ මිනිත්තු 45<br>5 වසරඃ මිනිත්තු 45<br>7 වසරඃ මිනිත්තු 45<br>9 වසරඃ මිනිත්තු 45 | කියවීම පරීක්ෂණයට පසු සම්පූර්ණ කල යුතුය | මෙම විභාගයට අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණය සහ විරාම ලකුණු අඩංගු වේ |
| සංඛ්‍යා හැකියාව | 3 වසරඃ මිනිත්තු 45<br>5 වසරඃ මිනිත්තු 50<br>7 වසරඃ මිනිත්තු 65<br>9 වසරඃ මිනිත්තු 65 | භාෂා සම්මතයන් පරීක්ෂණයට පසු සම්පූර්ණ කල යුතුය | මෙම විභාගයට සංඛ්‍යා සහ වීජ ගණිතයෂ මිනුම සහ ජ්‍යාමිතියෂ සහ සංඛ්‍යානය සහ සම්භාවිතාව අඩංගු වේ |

## ඇගයුම් පවත්වන දිනවල මගේ ළමයා පාසැලට නොපැමිණිය හොත් කුමක් සිදුවේද?

පරීක්ෂණ පවත්වන අවස්ථාවේ පාසැලට නොපැමිණි සිසුන් සඳහා පාසලේ පරීක්ෂණ පැවැත්වෙන කාල සීමාව තුළදී වෙන වේලාවක එම මගහැරුනු පරීක්ෂණ නිම කිරීමට පාසැල විසින් හැකි සෑම විටකම කටයුතු සලසනු ඇත. 2019 මැයි 24 වන සිකුරාදා දිනයෙන් පසුව මාර්ගගත NAPLAN පරීක්ෂණ වලට පෙනී සිටීමට සිසුන්ට අවසර නැත.

## මගේ ළමයාගේ කාර්ය සාධනය මනින්නේ කෙසේද?

එක් එක් පරීක්ෂණයේදී යම් ශිෂ්‍යයෙක් විසින් පෙන්වන ලද කුසළතා ජාතික සාධන පරිමාණයක් මගින් පෙන්නුම් කරනු ලැබේ. ජාතික අවම ප්‍රමිතියක ප්‍රතිඵලයකින් පෙන්වා දෙන්නේ සිසුවා එම වසර මට්ටමේ සහභාගිවීමට අවශ්‍යවන මූලික සාක්ෂරතා සහ සංඛ්‍යා හැකියා නිපුණතා පෙන්නුම් කර ඇති බවයි.

වසරේ පසු දවසක NAPLAN පුද්ගලික වාර්තාවක් ඔබේ ළමයාගේ පාසල පාසල විසින් නිකුත් කරනු ඇත. ඔබට වාර්තාවක් නොලැබුනොත් ඔබ ඒ ගැන ළමයාගේ පාසල අමතන්න.

## NAPLAN ප්‍රතිඵල ප්‍රයෝජනයට ගන්නේ කිනම් ආකාරයටද?

- ගුරුවරු සමග ප්‍රගතිය සාකච්ජා කිරීම සඳහා සිසුන්ට සහ දෙමාපියන්ට පුද්ගලික ප්‍රතිඵල උපයෝගී කරගත හැකිය.
- වැඩිතර අභියෝග හෝ අමතර ආධාර තුලින් උපකාරී විය හැකි සිසුන්ව වඩා හොඳින් හඳුනාගැනීම සඳහා ගුරුවරු මෙම ප්‍රතිඵල උපයෝගී කරගනී.
- ඉගැන්වීම් වැඩ සටහන්වල ශක්තීන් සහ දුර්වලකම් හඳුනාගැනීම සඳහාත් සාක්ෂරතා සහ සංඛ්‍යා හැකියා පිළිබඳ ඉලක්ක සැකසීම සඳහාත් පාසැල් විසින් මෙම ප්‍රතිඵල භාවිතා කරනු ලැබේ.
- වැඩ සටහන් සහ පාසැල් වලට සපයනු ලබන ආධාර සමාලෝචනය කිරීම පිණිස පාසැල් පද්ධති විසින් මෙම ප්‍රතිඵල භාවිතා කරනු ලැබේ.
- පාසල් NAPLAN ප්‍රතිඵල වල සාමාන්‍යය **myschool.edu.au** වෙතින් ප්‍රජාවට බලාගත හැකිය.

## මට වැඩිදුර තොරතුරු ලබා ගත හැක්කේ කොතැනින්ද?

NAPLAN ගැන වැඩිදුර තොරතුරු සඳහාඃ

- ඔබේ ළමයාගේ පාසැල අමතන්න
- ඔබේ ප්‍රදේශයේ විභාග පරිපාලන අධිකාරිය අමතන්න **nap.edu.au/TAA**
- **nap.edu.au** වෙත යන්න

NAPLAN පිළිබඳ පෞද්ගලික තොරතුරු ACARA විසින් පාවිච්චි කරනු ලබන අන්දම ගැන තොරතුරු සඳහා **nap.edu.au/naplanprivacy**